# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

**8 ශ්‍රේණිය**

## පෙරදිග සංගීතය - I/ II

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

### I කොටස

**නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) ශුද්ධ ස්වර හතම යෙදෙන රාගය වන්නේ
1) බිලාවල් 2) භූපාලි 3) කාෆි

02) | සි ර ස | න ම මු | ම ව් පො | ළො ව ට | මෙම ස්වර ස්ථාන ගී පාදය ප්‍රස්තාර වී ඇති තාලය
1) ත්‍රිතාල් 2) ලාවනී 3) දාදරා

03) තාලයක දුර්වලම ස්ථානය
1) ඛලිය 2) සමග්‍රහය 3) අනුතාලස්ථාන

04) භූපාලි රාගයට අනුව පහත ස්වර රටාවේ මීළඟ ආරෝහණ ස්වර ඛණ්ඩය **ස රි ග, රි ග ප**
1) ප ධ ස් 2) ග ප ධ 3) ග ප නි

05) මාත්‍රා 2 හා 3 බැගින් විභාග වන හින්දුස්ථානි තාලය
1) දාදරා 2) ඣප් තාල් 3) දීප්චන්දි තාල්

✶ **පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද යොදන්න.**

06) නූර්ති ගී සඳහා යොදා ගන්නා තාල වාද්‍ය භාණ්ඩය ගැට බෙරයයි. ( )

07) දාදරා තාලයේ මාත්‍රා ගණන 8 කි. ( )

08) භූපාලි රාගයේ ම සහ නි ස්වර නොයෙදේ. ( )

09) එස්රාජය වාදනය සඳහා මිස්රාබය යොදා ගනී. ( )

10) ඡේකාව යනු තාලයක අවනද්ධ පදයයි. ( )

✶ **නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.**

11) දාදරා තාලයට සමාන මාත්‍රා බෙදෙන්නේ

12) මාත්‍රා 3 සහ 4 බැගින් යෙදේ.

13) අළුවෙන් වාදනය කරයි.

14) සුළු තනි තිතට අනුව මාත්‍රා බෙදේ.

15) ප්‍රධාන තත් 7කින් සමන්විතය.

- දීප්චන්දි තාලය
- මැදුම් තනි තිත
- සිතාරය
- එස්රාජය
- ලාවනී තාලය

✶ **නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

**(කමත් ගී / අන්තරා / නෙළුම් ගී / සමග්‍රහය / සුළු මැදුම් දෙතිත)**

16) ගොයම් පාගන විට .............................. අසන්නට හැකි වේ.

17) කුඹුරේදී ඉතා සංයමයෙන් කළ යුතු ක්‍රියාවලියක් හා බැඳේ ..................................

18) ගීතයක දෙවන පද කොටස .............................. නම් වේ.

19) .............................. තාලයක ප්‍රබලතම තාලස්ථානයයි.

20) රන්වන් කරල් සැලෙයි ගීතයේ මාත්‍රා බෙදී ඇත්තේ .............................. ට අනුව ය.

## II කොටස

**ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු සපයන්න.**

01) පහත දැක්වෙන ප්‍රචලිත ගීත දාදරා තාලයට හා දීප්චන්දි තාලයට අනුව බෙදා වෙන්කර දක්වන්න.

a) නිල් අහස් තලේ අගේ

b) ඇසේ මතුවන කඳුළු බිඳු ගෙන

c) සසර වසන තුරු

d) සැඳෑ කළුවර කුර ගගා විත්

e) එකට සතුටු සාගරේ

f) මොකද මැණිකේ හනික යන්නේ

(ල 12)

02)

i. එස්රාජය පිළිබඳ කරුණු හතරක් ලියන්න. (ල 8)

ii. එස්රාජයේ කොටස් හතරක් නම් කරන්න. (ල 4)

03) ත්‍රිතාලය හෝ දීප්චන්දි තාලය නිවැරදි සංකේත සහිතව ප්‍රස්තාර කරන්න. (ල 12)

04) බිලාවල් රාගයේ හෝ භූපාලි රාගයේ හෝ ස්වර ස්ථාපන ගීතයක ස්ථායි කොටස පමණක් පද ප්‍රස්තාර කරන්න. (ල 12)

05)

i. සඳැස්මත් හා ගීමත් හඳුන්වන්න. (ල 4)

ii. පහත ජන ගී පාදයේ සඳැස්මත් හා ගීමත් ගණන සොයන්න. (ල 4)

| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දො | යි | දො | යි | දො | යි | s | s | දො | යි | ය | බ | බා | s | s | s |
| | A | | | | B | | | | C | | | | D | | |

iii. මෙම ගී පාදයේ යති පිහිටා ඇති විභාග නම් කරන්න. (ල 2)

iv. මෙම ගී පාදය අයත් තිත නම් කරන්න. (ල 2)

06) පහත ඒවායින් හතරකට කෙටි සටහන් ලියන්න.

i. බලිය

ii. මිස්රාබය

iii. ස්ථායි

iv. අළුව

v. මද්දලය

(ල 12)

07) පහත දැක්වෙන ගීතවලින් එක් ගීතයක ස්ථායි කොටස හා එක් අන්තරා කොටසක් ලියන්න.

i. භජන් ගී

ii. නූර්ති ගී

iii. මා පිය ගුණ වරුණ ගී

iv. දමිළ ගී

(ල 12)

08) බටහිර සංගීතයේ එන රේඛා මණ්ඩලය ඇඳ ඒ මත ස, රි, ග, ම, ප, ධ, නි යන පෙරදිග ස්වර මිනිම් සංකේතය ඇසුරින් සලකුණු කරන්න. (ල 12)